# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2044/2 - 2017 නොවැම්බර් මස 06 වැනි සඳුදා - 2017.11.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

**යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් බිහිවන භූමියේ යටිතල පහසුකම් සහ සංවර්ධන කටයුතු සිදු කිරීම පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1981 අංක 57 දරන වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහල දරන ලිපිනයේ මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ගොඩ කරනු ලබන භූමියේ යටිතල පහසුකම් සහ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්‍ෂාව සඳහා පහත සඳහන් ස්ථානවලදී දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2017.11.06 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මඟින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

(1) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - නො. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10
(2) වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10
(3) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - 3 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10
(4) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - සර් මාර්ක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07
(5) මධ්‍යම පරිසර අධිකාරිය - ''පරිසර පියස'', නො. 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
(6) මාර්ග සංවර්ධන අධිකාරිය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල
(7) සමුද්‍රිය පරිසර ආරක්‍ෂණ අධිකාරිය - බේස්ලයින්පාර, කොළඹ 09


1A - G 0 26543 - 27 (2017/11)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(8) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නාරහේන්පිට, කොළඹ 05
(9) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඩෑම් වීදිය, කොළඹ 12
(10) කොළඹ මහනගර සභාව - කොළඹ

මෙම යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2017.11.06 දින සිට දින 30ක් ඇතුලත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
වැ.බ. අධ්‍යක්‍ෂ ජනරාල්.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10

දුරකථන අංක - 011 2449754, 011 2449197, 011 2387922
ෆැක්ස් අංක - 011 2438005, 011 2472623

11 - 910

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.